ශීර්ෂය - 296 ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 296 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා

හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 7.7 උපවගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරිමේ දී මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන ඍජු ක්‍රමය භාවිත කරමින් පිළියෙලකල යුතු වුවද, විද්‍යුත් බලපත්‍ර නිකුත් කිරිමේ වැඩසටහන සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මකවන EXBS වැඩසටහන යටතේ ප්‍රදානයක් ලෙස ලබා දී තිබූ එකතු වටිනාකම රු.19,880,000ක ලැප් ටොප් (Lap Top) පරිගණක 20ක හා මෘදුකාංගවල වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ආදායම් නොවන ලැබිමක් ලෙසද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීමේ වියදමක් ලෙසද දක්වා තිබුණි.	මේ සඳහා අතිරේක ප්‍රතිපාදන ලබාගෙන ගිණුම්ගත කිරීම හේතුවෙන් මුදල් ප්‍රවහා ප්‍රකාශයේ ඇතුලත් කර ඇත.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කිසියම් නිශ්චිත ව්‍යාපෘතියක ඍජුවම ප්‍රයෝජනයට ගැනීම සඳහා ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් විදේශ ප්‍රාග්ධන ආධාර ලැබූ කල්හි එම අයිතමයන්ට අදාළ ලිපි ලේඛනවල තොරතුරු පදනම් කරගෙන එකී ප්‍රදානයේ රුපියල් වටිනාකම දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ඇමරිකා එක්සත් ජනපද තානාපති	**EXBS** වැඩසටහන මගින් 2024 ඔක්තෝම්බර් මස සිට දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානයක් වශයෙන් ලද පරිගණක වලට අදාලව **Property Transfer Agreement** අත්සන් කිරීමෙන් පසුව ගිණුම්ගත කිරීමේ කටයුතු සිදු කිරීමට ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම සිදු	ප්‍රදානයේ වටිනාකම නිෂ්චයකර ගිණුම්ගත කළයුතු බව.

කාර්යාලයේ EXBS වැඩසටහන මඟින් ප්‍රදානයක් වශයෙන් ලැබී තිබුණු ඇ.එ.ඩො.62,303.86ක් වටිනා පරිගණක 60, තොග ලේඛනවල සටහන් කර තිබුනද එම පරිගණකවල වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	කල යුතුය. මේ වන විට එම ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර ඇති බැවින්, කඩිනමින් ප්‍රතිපාදන ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආදායම් සංකේත අංක 1001-03-00 යටතේ බලපත්‍ර ආදායම් සඳහා මූලික ඇස්තමේන්තුව රු.2,900,000,000 ක් වූ අතර පසුව මූලික ඇස්තමේන්තුව රු.3,100,000,000 දක්වා වැඩිකර තිබුණි. එහෙත් වර්ෂය තුළ රු3,762,582,369ක බලපත්‍ර ආදායමක් උපයා තිබීම හේතුවෙන් නිවැරදි පුරෝකතනයන්ට අනුකූලව ආදායම් ඇස්තමේන්තු සකස් කර නොමැති බව නිරීක්ෂණය විය	ආදායම් රැස්කිරීමේ ප්‍රමාණය රජයේ කලින් කලට වන තීරණ මත සිදුවන වාර්ෂිකව නිකුත්වන ගැසට් පත්‍ර අනුව තීරණය වන අතර, එම අගය නිවැරදිවම ඇස්තමේන්තු කිරීම දුෂ්කර වේ. පසුගිය වර්ෂ වල ආදායම් ලැබීමේ ප්‍රවණතාවය හා වෙනස්වීමට යෝජිත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සලකා බලා වඩාත් සාධාරණ ඇස්තමේන්තුවක් පුරෝකතනය කිරීමට කටයුතු කරනු ලැබේ.	ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව පුරෝකථනය කළ තොරතුරු මත ඇස්තමේන්තු සකස් කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 පුනරාවර්තන වියදම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයන් 16 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට 100 ක් දක්වා වු පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	ඉදිරියේදී හැකිතාක් නිවැරදිව වියදම් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සටහන් කර ගතිමි.	ඇස්තමේන්තු සකස් කිරිමේදී හැකිතාක් නිවැරදිව පුරෝකථනය කළ තොරතුරු මත ඇස්තමේන්තු සකස් කළ යුතුය.
(ආ)	ප්‍රවර්ථන වර්ෂයේ දී මෙන්ම පූර්ව වර්ෂයේ දීද මූලික ඇස්තමේන්තුවෙන් සියයට 25කට ආසන්න මුදලක් මු.රෙ.66/69 යටතේ වෙනත් වැය විෂයන්ට ප්‍රතිපාදන මාරු කිරීම් ඇතුළත් ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා (1201) සඳහා වෙන් කරන ලද වැය විෂයෙන් සියයට 49ක් ඉතිරි වී තිබුණි.	ඉදිරියේදී හැකිතාක් නිවැරදිව වියදම් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සටහන් කර ගතිමි.	ඇස්තමේන්තු සකස් කිරිමේදී හැකිතාක් නිවැරදිව පුරෝකථනය කළ තොරතුරු මත ඇස්තමේන්තු සකස් කළ යුතුය.

3.2.2 මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 සිට සියයට 88 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	ඉදිරියේදී වැය ශීර්ෂවල ප්‍රතිපාදන නිවැරදිව පුරෝකථනය කිරීමට සටහන් කර ගතිමි.	වියදම් ඇස්තමේන්තු සකස් කිරිමේ දී හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පුරෝකථනය කළ යුතු බව.

3.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	මු.රෙ.371(2)ආ වගන්තිය	අතුරු අග්‍රිම ලබා දීම මාණ්ඩලික නිලධාරින්ට පමණක් සීමා විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදි ගොඩනැගිලි කුලී අත්තිකාරම් ලෙස ගොඩනැගිලි හිමිකරු වෙත රු.100,000ක තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දී තිබුණි.	ඊ.ටී.ප්‍රොපටීස් ආයතනයට විදුලි පරිභෝජනය අදාලව රු.100,000/-ක ඇප තැන්පතු මුදලක් සෑම වර්ෂයකම ආරම්භයේදී තැන්පත් කල යුතු අතර එය නැවත ආපසු ගෙවන වියදමක් බැවින් අත්තිකාරම් ලෙස ගෙවීම් කර ඇත. එය නැවත වසර අවසානයේ අප දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් පසුව පියවීම් සිදු කරන බැවින් ඒ සඳහා දින 345 කාලයක් ගතවී ඇත. මෙය මෙතෙක් තත්කාර්ය අතුරු අග්‍රිමයක් වශයෙන් ලබා දී ඇති අතර අඛණ්ඩ අග්‍රිමයක් වශයෙන් නිවැරදි කිරීමට සටහන් කර ගතිමි.	මුදල් රෙගුලාසි විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය			
	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති	සේවය හැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු වර්ෂ 3ක් දක්වා පැරණි රු.458,816ක ණය ශේෂය හා වැඩ තහනම් කළ නිලධාරින්ගෙන් අය විය යුතු වර්ෂ 1 සිට 3 දක්වා පැරණි රු.335,753ක ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව	හිඟ ශේෂය වන රු. 182,692ක් 2024 දෙසැම්බර් 26 දින සිට සේවය හැර ගිය සේවකයෙකු බව දන්වා ඇත. ඔහු 2025.03.26 දින නැවත සේවයේ පිහිටුවා ස්ථාන මාරු කර ඇති අතර එම ණය ශේෂය නව ආයතන ප්‍රධානියා වෙත් දන්වා යවා ඇත. වැඩ තහනම් කරන ලද නිලධාරිනියගෙ ණය මුදල පියවා ගැනීම සඳහා අවසන් නිවේදනය	ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය.

ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඇය වෙත යොමු කර ඇති අතර නීතිපති වෙත උපදෙස් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. වැඩ තහනම් කල හා තනතුරු අතහැර ගිය නිලධාරින්ගේ ණය ශේෂයන් සම්බන්ධව නීතිපති වෙත උපදෙස් ලබා ගැනීමට යොමු කර ඇත. තනතුර අතහැර ගිය නිලධාරියෙකුගෙ ඇපකරුවන්ගෙන් වැටුපෙන් අයකර මාසිකව මෙම දෙපාර්තමේන්තුවේ ගිණුමට බැර කරනු ලැබේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතින් පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණු අතර බලපත්‍ර ගාස්තු අයකිරීම ප්‍රධාන කාර්යය ලෙස සළකා කටයුතු කර තිබුණි.	විවිධ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මගින් ආනයන හෝ අපනයන බලපත්‍ර නිකුත් කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් පමණක් පාලනය සිදු කරනු ලබන අතර, එකී භාණ්ඩ ආනයනය හෝ අපනයනය සම්බන්ධයෙන් රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව අදාළ පාලනය සිදු කරනු ලැබිය යුත්තේ ප්‍රමාණාත්මකව ද, ගුණාත්මකව භාවය අනුව ද, යම් කාල සීමාවකට යටත්ව ද වැනි කරුණු තීරණය කෙරේ. (උදා. සහල් හා බඩ ඉරිඟු ආනයන පාලනය, වාහන ආනයන පාලනය)ක්ෂේත්‍රයන් සම්බන්ධය කටයුතු කිරීම පිණිස ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතන මගින් ලබා දී ඇති නිර්දේශ මත ද බලපත්‍ර නිකුත් කිරීම මගින් එම ක්ෂේත්‍රයන්ට අදාළ භාණ්ඩ ආනයනය සම්බන්ධයෙන් පාලනය පවත්වා ගැනීමට කටයුතු කර ඇත.	1969 ජනවාරි 16 දිනැති අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු දැක්ම හා මෙහෙවර අනුව අහිතකර ආනයනයන් හා අපනයනයන් පාලනය කිරිම සඳහා සුදුසු විද්‍යාත්මක ක්‍රමවේදයක් සකස් කළ යුතුය

4.2 දෙපාර්තමේන්තුවේ වගකීම හා කාර්යභාරය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම සහ එකී රෙගුලාසි වලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම ද දෙපාර්තමේන්තුවේ වගකීම් සහ කාර්ය භාරයන් වශයෙන් දැක්වුවද දෙපාර්තමේන්තුව ආනයන පාලනයට අදාළ කාර්යයන්හි පමණක් නිරතවී තිබුණු අතර අපනයනයන්ට අදාළ කිසිදු රෙගුලාසියක් නිකුත් කළ බවට විගණනයට නිරීක්ෂණය නොවුණි.	අපනයන දිරි ගැන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මත ක්‍රියාකරමින් අපනයන පාලනය සම්බන්ධයෙන් දැඩි නීතිරීති පැනවීමක් සිදු කර නොමැති අතර, 2017.11.09 දිනැති අංක 2044/41 දරණ ගැසට් නිවේදනය අනුව දැනට අපනයන සම්බන්ධයෙන් සීමිත පාලනයක් පවත්වාගෙන යනු ලැබේ. එකී ගැසට් පත්‍රය ද යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් ඇත.	දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු පරමාර්ථ පෙරදැරිව අභ්‍යන්තර වැඩපිළිවෙළක් සකස් කළ යුතුය.

5. යහපාලනය

5.1 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආනයන බලපත්‍රවල ඇතුලත් කොන්දේසි කඩකරනු ලබන ආනයනකරුවන් ප්‍රසිද්ධ කිරීමට හා ඊට අමතරව ඔවුනට දඩුවම් ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාත්මක කරන ලෙස, රාජ්‍ය ගිණුම්කාරක සභාව ලබා දී තිබූ නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.	ආනයන බලපත්‍රවල ඇතුළත් කොන්දේසි කඩකරනු ලබන ආනයනකරුවන්ගෙන් අංක 1953/28 දරණ ගැසට් නිවේදනයේ ප්‍රතිපාදන අනුව දඩ මුදල් අයකිරීමට කටයුතු කරන අතර, ඇතැම් ආනයන ප්‍රති-අපනයනය කිරීමට නියෝග කිරීම සඳහා ද කටයුතු කර ඇත (2024.05.17 දිනැති අංක 2384/35 දරන ගැසට් නිවේදනය හා 2025.01.31 දිනැති අංක 2421/44 දිනැති ගැසට් පත්‍ර). කොන්දේසි කඩ කරනු ලබන ආනයනකරුවන් ප්‍රසිද්ධ කිරීම සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් කර ඇති අතර, එම නීති අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයන්ට අනුකූලව කටයුතු කල යුතුය

(ආ)	දෙපාර්තමේන්තුවේ පාලනයට යටත්වන භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංක (HS Codes) යටතේ ආනයන කරනු ලබන භාණ්ඩ අධීක්ෂණය කිරීමට හා ආනයන පාලනයට යටත් විය යුතු අනෙකුත් භාණ්ඩ සම්බන්ධයෙන් ද සොයා බලා සුදුසු භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංක යටතේ ආනයන පාලනයට යටත් කිරීමට ගිණුම් කාරක සභාව ලබා දී තිබූ නියෝගයට අනුව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි	මේ සම්බන්ධයෙන් අවශ්‍ය සාකච්ඡා පවත්වමින් ඇත. ඒ අනුව, ඉදිරියේ දී ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලනයට ලක් විය යුතු හා පාලනයෙන් ඉවත් කළ යුතු සංයෝජිත වර්ගීකරණ අංක හඳුනා ගැනීමට නියමිත වේ.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කර තිබූ වාහනවල අයිතිය මාරු කිරීමේ දී යම් අක්‍රමිකතාවක් සිදුව තිබේද යන්න මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී පරීක්ෂා කරන ලෙස ලබා දී තිබූ ගිණුම් කාරක සභා නියෝගය ඉටුකර නොතිබුණි.	මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ අතර, මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/HI/ICT/IMFO/03 හා 2024/05/08 දිනැති ලිපිය මගින් එවන ලද වාහන 208හි වර්තමාන දත්ත අනුව වාහන 24ක අයිතිය පමණක් පළමු ලියාපදිංචි දිනයේ සිට වසර 05ක් ඉකුත් වීමට පෙර වෙනත් පාර්ශ්වයන් වෙත පවරා ඇති බව නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් පරීක්ෂා කිරීම සඳහා 2024/11/05 දින මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ගිය අතර, එහිදී අදාල පරීක්ෂා කිරීම් සඳහා තවදුරටත් කාලය අවශ්‍ය බව හා අදාල තොරතුරු ලිඛිතව වාර්තා කරන ලෙසටත් දන්වා තිබූ බැවින්, 2024/11/24 දිනැති ලිපිය මගින් හා 2025/03/14 සිහිකැඳවීම් ලිපිය මගින්, එම වාහන 24හි අයිතිය පැවරීම බලපත්‍ර කොන්දේසි ප්‍රකාරව සිදු නොවීමට හේතු විමසන ලදී.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දී ආනයන බලපත්‍ර ලබා දීම සඳහා පරිගණක වැඩසටහනක් හඳුන්වා දී ක්‍රියාත්මක කර ඇති බැවින් දෙපාර්තමේන්තුවේ සේවක අවශ්‍යතාව පිළිබඳ නැවත ඇගයීමක් සිදු කර කාර්යය මණ්ඩල අවශ්‍යතාවය හඳුනා ගැනීම සුදුසු බව නිරීක්ෂණය කරමි.	සමාලෝචිත වර්ෂයේ දී ආනයන බලපත්‍ර ලබා දීම සඳහා පරිගණක වැඩසටහන හඳුන්වා දී ක්‍රියාත්මක කර අතරතුර ඇගයිමක් සිදුකර ඇති අතර, එහි නිර්දේශ ප්‍රකාරව නැවත මාස 6කින් ඇගයීමක් සිදුකර අදාල කාර්යමණ්ඩලය සංශෝධනය සිදුකිරිමට ක්‍රියාකරමි.	සේවක අවශ්‍යතාවයන් පිළිබඳ කඩිනමින් සමාලෝචනයක් සිදුකර කාර්ය මණ්ඩල සංශෝධනයක් සිදු කළ යුතුය.